www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

| 11 ශ්‍රේණිය | ඉතිහාසය | 7 ඒකකය |
|---|---|---|

## ලෝකයේ කැපී පෙනෙන විප්ලව

- ❖ **පාඩම් ඒකක ප්‍රශ්න මාලාව**
- ❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **පහත සඳහන් ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. බ්‍රිතාන්‍යයන් විසින් ඇමරිකානු භූමියේ පිහිටවූ මුල්ම ජනපදය කුමක්ද?
(1). මැසචුසෙට්ස් (2). ජෝර්ජියා (3). නිව්යෝර්ක් (4). වර්ජිනියා

02. ඇමරිකානු ජනපද සම්බන්ධව බ්‍රිතාන්‍යයන් අනුගමනය කළ ආර්ථික හා වෙළඳ ප්‍රතිපත්තිය හා සමග නොගැළපේ.
(1). බ්‍රිතාන්‍යයන් නිපදවන ද්‍රව්‍යය ඇමරිකානු ජනපද තුළ නිපදවීම තහනම් වීම
(2). ජනපදවල නිපදවන දුම්කොළ, සීනි, කපු, මී ඉටි, තිරිඟු, තඹ වැනි ද්‍රව්‍ය බ්‍රිතාන්‍යයට පමණක් ලබා දිය යුතු වීම.
(3). නිෂ්පාදන හා වෙළෙඳාම අතින් සෑම රටක් සමග (බ්‍රිතාන්‍යයද ඇතුලුව) තරග කළ යුතු වීම
(4). සෑම භාණ්ඩයක්ම අපනයනය කළ හැක්කේ බ්‍රිතාන්‍යය හරහා පමණක් වීම

03. නියෝජිතයන් නැතිනම් බදුත් නැත යන සටන් පාඨය බිහි වූයේ කුමන විප්ලවය පදනම් කරගෙනද?
(1). ඇමරිකන් විප්ලවය (3). චීන සමූහාණ්ඩු විප්ලවය
(2). ප්‍රංශ විප්ලවය (4). රුසියානු විප්ලවය

04. ඇමරිකානු නිදහස් විප්ලවය පිළිබඳ ඉතිහාසයේ ප්‍රථම මහද්වීපික සම්මේලනය පැවැත්වූයේ කුමන නගරයේද?
(1). මැසචුසෙට්ස් (2). පිලඩෙල්පියා (3). ඩෙලවෙයාර් (4). ලෙක්සින්ටන්

05. ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපතිවරයා ලෙස පත්වූයේ කවුරුන්ද?
(1). ජෝර්ජ් බුෂ් (3). ජෝර්ජ් ග්‍රැන්විල්
(2). ජෝර්ජ් වොෂින්ටන් (4). ජෝර්ජ් ඩබ්ලිව් බුෂ්

06. ප්‍රංශ විප්ලවය සිදු වූයේ කුමන වර්ෂයක් තුළදීද?
(1). 1688 (2). 1736 (3). 1789 (4). 1849

07. ''රාජ්‍යය නම් මමයි'' යනුවෙන් ප්‍රකාශ කළ ප්‍රංශ පාලකයා කවුරුන්ද?
(1). දාහතරවන ලුවී රජු (3). දාසයවන ලුවී රජු
(2). පහලොස්වන ලුවී රජු (4). දාහත්වන ලුවී රජු

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk

08. පාලනය තුළ, දූෂිත පාලනයේ සංකේතයක් ලෙස සලකන බැස්ටීල් බන්ධනාගාරය පිහිටි රට කුමක්ද?
(1). ඇමරිකාව (2). ස්පාඤ්ඤය (3). රුසියාව (4). ප්‍රංශය

09. ප්‍රංශ විප්ලව සමය වන විට සමාජය ප්‍රධාන වශයෙන් බෙදීගිය ස්ථර තුනට අයත් නොවන පිළිතුර කුමක්ද?
(1). පූජකයන්
(2). සාමාන්‍ය ජනතාව
(3). රදළයන්
(4). කම්කරුවන්

10. ප්‍රංශ විප්ලවයට නව නැම්මක් ලබාදීම සඳහා දාර්ශනික මතවාද ඉදිරිපත් කළ පුද්ගලයකු නොවේ.
(1). මොන්ටෙස්ක්‍යු (2). වෝල්ටෙයාර් (3). ප්ලේටෝ (4). රූසෝ

11. ප්‍රංශ විප්ලවය සිදුවන අවිධිය වන විට ප්‍රංශය තුළ සිටි පාලකයා කවුරුන්ද?
(1). දාහතරවන ලුවී රජු
(2). පහළොස්වන ලුවී රජු
(3). දාසයවන ලුවී රජු
(4). දාහත්වන ලුවී රජු

12. 1799 වන විට ප්‍රංශයේ පැවති අස්ථාවර දේශපාලන තත්ත්වය නිසා බලයට පැමිණිය හැකි වූ හමුදා නායකයා කවුරුන්ද?
(1). නැපෝලියන් බොනපාට්
(2). ලෆායෙට්
(3). වෝල්ටෙයාර්
(4). පහළොස්වන ලුවී රජු

13. 1917 මාර්තු මාසයේ රුසියාව තුළ සිදු වූ විප්ලවය ආරම්භ වීමට බලපෑ හේතුව කුමක්ද?
(1). රෙදි කම්හලක ඇතිවූ වැඩවර්ජනය
(2). ගොවියන් ගෙනගිය විරෝධතාවන්
(3). වෙළෙන්දන් ගෙනගිය විරෝධතාවන්
(4). බෝල්ෂෙවික් පක්ෂය ගෙනගිය විරෝධතා ව්‍යාපාරය

14. 1917 මාර්තු මාසයේ විප්ලවයෙන් පසු රුසියාවේ බලය අල්ලාගත් දේශපාලන නායකයා කවුරුන්ද?
(1). වී.අයි. ලෙනින්
(2). ලියෝන් ට්‍රොට්ස්කි
(3). ලෆායෙට්
(4). කෙරෙන්ස්කි

15. රුසියාව සෝවියට් සමූහාණ්ඩුවක් බවට පත්වන ශ්‍රේෂ්ඨ සමාජවාදී විප්ලවය සිදුවන්නේ කවරදාද?
(1). 1917 මාර්තු මාසයේදී
(2). 1917 ජුනි මාසයේදී
(3). 1917 ඔක්තෝබර් මාසයේදී
(4). 1917 නොවැම්බර් මාසයේදී

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

Agaram.LK - Keep your dreams alive!

## II කොටස

16. පහත දී ඇති ලෝක සිතියමේ පහතින් දී ඇති ස්ථාන ලකුණු කර දක්වන්න.

(ප්‍රංශය, රුසියාව, ඇමරිකා එක්සත් ජනපදය, ස්පාඤ්ඤය, ඕලන්දය, ජපානය, ඉතාලිය)



17. රූපසටහන් ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ). 

(i). රූපයේ සිටින පුද්ගලයා කවුරුන්ද? ..............................................

(ii). ඔහු කුමන රටේ පාලකයාද? ..............................................

(iii). මොහුගේ පාලනයට විරුද්ධව මතුවූ විප්ලවය කුමක්ද?

..............................................................................

(iv). මොහුගේ පාලන කටයුතුවලට සම්බන්ධ වූ බිසව කවුරුන්ද?

..............................................................................

(ආ). 

(i). රූපයේ සිටින පුද්ගලයා කවුරුන්ද? ..............................................

(ii). මොහු ජීවත් වූ රට කුමක්ද? ..............................................

(iii). මොහු බලයට පත්වූයේ කුමන විප්ලවයෙන්ද?

..............................................................................

(iv). මොහුගේ දේශපාලන පක්ෂය කුමක්ද?

..............................................................................

(ඇ). 

(i). රූපයේ සිටින පුද්ගලයා කවුරුන්ද? ..............................................

(ii). මොහු ජීවත් වූ රට කුමක්ද? ..............................................

(iii). මොහු නියෝජනය කරන ලද දේශපාලන පක්ෂය කුමක්ද?

Agaram.LK - Keep your dreams alive!

.....................................................................................................

(iv). මොහු නියෝජනය කරන දේශපාලන මතවාදය බලයට ගෙන ඒම සඳහා සිදු වූ විප්ලවය සිදු වූයේ කවරදාද? ....................................

(ඇ). 

(i). රූපයේ සඳහන් ස්ථානය කුමක්ද? ............................................

(ii). මෙය පිහිටා තිබුණේ කුමන රටකද? ........................................

(iii). මෙම ස්ථානය කුමක් සඳහා භාවිතා වූයේද?

.........................................................................................

(iv). මෙම ස්ථානය කුමන විප්ලවයක් හා සම්බන්ධද?

.........................................................................................

(ඉ). 

(i). රූපයේ සඳහන් ස්ථානය කුමක්ද? ............................................

(ii). මෙය කුමන රටක පිහිටා තිබේද? ............................................

(iii). මෙය කුමන රජ පෙළපතක් භාවිතා කළේද?

.........................................................................................

(iv). මෙම මාලිගය කුමන විප්ලවය සඳහා බලපෑවේද?

.........................................................................................

18. පහත සඳහන් කෙටි ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(අ). (i). ඇමරිකානු නිදහස් සටනේ සටන් පාඨය වූයේ කුමක්ද?

.........................................................................................

(ii). රුසියානු විප්ලවයේ තේමාව වූයේ කුමක්ද?

.........................................................................................

(iii). ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන සටන් පාඨය වූයේ කුමක්ද?

.........................................................................................

(iv). ''මා අපේක්ෂා කරන ඕනෑම දෙයක් නීත්‍යානුකූලයි'' යනුවෙන් ප්‍රකාශ කරන ලද පාලකයා කවුද? ........................................................

(ආ. (i). ''නීතියේ ක්ෂාරය'' නම් කෘතිය රචනා කරන ලද්දේ කවුරුන්ද?

.........................................................................................

(ii). ''සමාජ සම්මුතිය'' නම් ග්‍රන්ථය රචනා කරන ලද්දේ කවුරුන්ද?

.........................................................................................

(iii). ''රූසෝ'' තම ග්‍රන්ථය මගින් ඉදිරිපත් කරන ලද සංකල්පය කුමක්ද?

.........................................................................................

(iv). රුසියන් විප්ලවයට පෙර, රුසියාවේ පාලන කටයුතු ගෙනගිය පාලකයන් කවුරුන්ද?

.........................................................................................

- **පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

19. (i). බ්‍රිතාන්‍ය අගමැතිවරයා වූ ග්‍රෙන්විල් බ්‍රිතාන්‍යයට පැනවූ බදු පනත් තුන කවරේද?

(ii). යුරෝපීයන් ඇමරිකාවේ ජනපද පිහිටුවීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(iii). ඇමරිකන් විප්ලවයට තුඩුදුන් හේතු හතරක් ලියන්න.

(iv). ඇමරිකානු නිදහස් සටනේ ප්‍රතිඵල තුනක් විස්තර කරන්න.

20. (i). ප්‍රංශ විප්ලවයට බලපෑ දාර්ශනික මතවාද ඉදිරිපත් කළ පුද්ගලයන් තිදෙනෙකු ලියන්න.

(ii). ප්‍රංශ විප්ලවයට බලපෑ සමාජ හේතුන් දෙකක් ලියන්න.

(iii). ප්‍රංශයේ ආර්ථික පිරිහීමට බලපෑ ප්‍රධාන හේතු දෙකක් විස්තර කරන්න.

(iv). ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල මොනවාදැයි විස්තර කරන්න.

21. (i). බෝල්ෂෙවික්වරුන්ට නායකත්වය සැපයූ පුද්ගලයන් තිදෙනෙකු ලියා දක්වන්න.

(ii). රුසියානු විප්ලවය ආරම්භ වන විට දේශපාලන මතවාදයන් ඉදිරිපත් කළ දේශපාලන කණ්ඩායම් දෙක කවුරුන්ද?

(iii). ලෝකය තුළ බිහි වූ සමාජවාදී කඳවුරට අයත් රටවල් කවරේද?

(iv). සමාජවාදී දර්ශනයේ මූලික ලක්ෂණ මොනවාදැයි විස්තර කරන්න.

22. (i). ඇමරිකා එක්සත් ජනපදය තුළ පිහිටුවාගත් ජනපද තුනක් ලියන්න.

(ii). ඇමරිකානු නිදහස් සටනට බලපෑ හේතු දෙකක් ලියන්න.

(iii). ප්‍රංශයේ සිටි රදලවරුන් භුක්තිවිඳින ලද වරප්‍රසාද මොනවාදැයි විස්තර කරන්න.

(iv). ටේල්, ගැබෙල්, කැපිටේෂන් යන බදුවර්ග තුන විස්තර කර දක්වන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk